# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2421/04 - 2025 ජනවාරි මස 27 වැනි සඳුදා - 2025.01.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4වන වගන්තියේ (1) වන උප වගන්තිය සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු 20 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මවිසින් සාදනු ලබන රෙගුලාසි.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2025 ජනවාරි මස 24 වැනි දින,
කොළඹ 01,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

**රෙගුලාසි**

1. මෙම රෙගුලාසි "**2025 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි**" ලෙස හඳුන්වනු ලැබේ.

2. "මෝටර් රථ වාහන ආනයනය කිරීම සඳහා වූ තාවකාලික අත්හිටුවීම ඉවත් කිරීම සඳහා අනුමැතිය" යන මැයෙන් ඉදිරිපත් කරන ලද 2024 සැප්තැම්බර් මස 12 දිනැති අංක 24/1945/604/208 දරන සංදේශය සඳහා 2024 සැප්තැම්බර් මස 13 දිනැතිව ලබාදුන් අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙම රෙගුලාසි පනවනු ලැබේ.

3. පසුව සංශෝධිත සහ 2024 දෙසැම්බර් මස 18 දිනැති අංක 2415/35 දරන අති විශේෂ *ගැසට්* පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2024 අංක 14 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි මගින් අවසන්වරට සංශෝධනය කරන ලද 2023 ජනවාරි මස 01 දිනැති අංක 2312/78 දරන අති විශේෂ *ගැසට්* පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි මෙයින් තවදුරටත් සංශෝධනය කෙරේ.

4. 2024 දෙසැම්බර් මස 18 දිනැති අංක 2415/35 දරන අති විශේෂ *ගැසට්* පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2024 අංක 14 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි, ඒ යටතේ සිදුකරන ලද ඕනෑම ක්‍රියාවක වලංගුභාවයට අගතියක් නොවන පරිදි මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4.1 ඉහත රෙගුලාසි අංක 4හි සඳහන් 2024 අංක 14 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි ප්‍රකාරව, 2024 දෙසැම්බර් මස 18 දින සිට 2025 ජනවාරි 27 දින දක්වා කාලසීමාව තුළ විවෘත කරන ලද ණයවර ලිපි මත පදනම්ව ආනයනය කරන ලද සහ 2023 දෙසැම්බර් මස 18 දින සිට 2025 ජූලි 31 දින දක්වා කාලසීමාව තුළ ශ්‍රී ලංකාවේ ඕනෑම වරායක් / ගුවන්තොටුපළක් වෙත ළඟා වූ ඕනෑම භාණ්ඩ(යක්) නිදහස් කිරීමට ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත මෙයින් බලය පවරනු ලැබේ.

5. මෙම රෙගුලාසිවල අනිවාර්ය අංගයක් වන පහත උපලේඛනයේ විස්තර කර ඇති සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ වර්ග කර ඇති භාණ්ඩ සහ ඒවාට අනුරූප සටහන්, 2023 ජනවාරි මස 01 දිනැති අංක 2312/78 දරන අති විශෙෂ *ගැසට්* පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල **I වන උපලේඛනයෙන්** ඉවත් කරනු ලැබේ;

**උපලේඛනය**

| | *I* තීරුව<br>**ශීර්ෂ අංකය** | *II* තීරුව<br>**සංයෝජිත වර්ගීකරණ සංකේතය** | | *III* තීරුව<br>**විස්තරය** | *IV* තීරුව<br>**තාවකාලික අත්හිටුවීම (TS) අ ලැයිස්තුව** | *V* තීරුව<br>**තාවකාලික අත්හිටුවීම (TS) ආ ලැයිස්තුව** |
|---|---|---|---|---|---|---|
| **198** | **87.02** | | | **රියැදුරු ඇතුළුව මගීන් දහ දෙනෙක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ප්‍රවාහනය සඳහා වූ මෝටර් වාහන.** | | |
| | | 8702.10 | - | සම්පීඩන-ජ්වලන අභ්‍යන්තර දහන පිස්ටන් එන්ජිම පමණක් සහිත (ඩීසල් හෝ අර්ධ-ඩීසල්): | | |
| | | | --- | රියැදුරු ඇතුළුව පුද්ගලයන් (වැඩිහිටියන්) 25 ක් හෝ වැඩියෙන් එහෙත් පුද්ගලයන් (වැඩිහිටියන්) 35 කට අඩුවෙන් ප්‍රවාහනය සඳහා වූ, අවුරුදු දහයකට වඩා නොපැරණි මෝටර් වාහන: | | |
| | | 8702.10.55 | ---- | අනෙකුත්, අවුරුදු පහකට වඩා නොපැරණි මෝටර් වාහන | **TS** | |
| | | | --- | අවුරුදු දහයකට වඩා නොපැරණි, අනෙකුත්: | | |
| | | 8702.10.75 | ---- | අනෙකුත්, අවුරුදු පහකට වඩා නොපැරණි මෝටර් වාහන | **TS** | |
| | | 8702.20 | - | සම්පීඩන-ජ්වලන අභ්‍යන්තර දහන පිස්ටන් එන්ජිම (ඩීසල් හෝ අර්ධ - ඩීසල්) සහ ඉදිරියට පැදවීම සඳහා මෝටර් වශයෙන් විදුලි මෝටර් යන දෙකම : | | |
| | | | --- | රියදුරු ඇතුළුව පුද්ගලයන් 25 දෙනෙකු (වැඩිහිටි) හෝ ඊට වැඩි ප්‍රමාණයක් එහෙත් පුද්ගලයන් 35 ට (වැඩිහිටි) වඩා අඩු ප්‍රමාණයක් ප්‍රවාහනය කිරීම සඳහා වන මෝටර් වාහන, වසර දහයකට වඩා නොපැරණි: | | |
| | | 8702.20.53 | ---- | අනෙකුත්, වසර 05 කට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | අනෙකුත්, වසර 10ට වඩා නොපැරණි: | | |
| | | 8702.20.73 | ---- | අනෙකුත්, වසර 05 කට වඩා නොපැරණි | **TS** | |
| | | 8702.30 | - | පුලිඟු-ජ්වලන අභ්‍යන්තර දහන පිස්ටන් එන්ජිම සහ ඉදිරියට පැදවීම සඳහා මෝටර් වශයෙන් විදුලි මෝටර් යන දෙකම සහිත: | | |
| | | | --- | රියදුරු ඇතුළුව පුද්ගලයන් 25 දෙනෙකු (වැඩිහිටි) හෝ ඊට වැඩි ප්‍රමාණයක් එහෙත් පුද්ගලයන් 35 ට වඩා අඩු ප්‍රමාණයක් ප්‍රවාහනය කිරීම සඳහා වන මෝටර් වාහන, වසර දහයකට වඩා නොපැරණි: | | |
| | | 8702.30.53 | ---- | අනෙකුත්, වසර 05 කට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | අනෙකුත්, වසර දහයකට වඩා නොපැරණි: | | |
| | | 8702.30.73 | ---- | අනෙකුත්, වසර 05 කට වඩා නොපැරණි | **TS** | |

උපලේඛනය *(සම්බන්ධිතයි)*

| | *I* තීරුව<br>**ශීර්ෂ අංකය** | *II* තීරුව<br>**සංයෝජිත වර්ගීකරණ සංකේතය** | | *III* තීරුව<br>**විස්තරය** | *IV* තීරුව<br>**තාවකාලික අත්හිටුවීම (TS) අ ලැයිස්තුව** | *V* තීරුව<br>**තාවකාලික අත්හිටුවීම (TS) ආ ලැයිස්තුව** |
|---|---|---|---|---|---|---|
| | | 8702.40 | - | ඉදිරියට පැදවීම සඳහා විදුලි මෝටරයක් පමණක් සහිත : | | |
| | | | --- | රියදුරු ඇතුළුව පුද්ගලයන් 25 දෙනෙකු (වැඩිහිටි) හෝ ඊට වැඩි ප්‍රමාණයක් එහෙත් පුද්ගලයන් 35ට (වැඩිහිටි) වඩා අඩු ප්‍රමාණයක් ප්‍රවාහනය කිරීම සඳහා වන මෝටර් වාහන, වසර දහයකට වඩා නොපැරණි: | | |
| | | 8702.40.53 | ---- | අනෙකුත්, වසර 05 කට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | අනෙකුත්, වසර දහයකට වඩා නොපැරණි: | | |
| | | 8702.40.73 | ---- | අනෙකුත්, වසර 05 කට වඩා නොපැරණි | **TS** | |
| | | 8702.90 | - | අනෙකුත් : | | |
| | | | --- | රියදුරු ඇතුළුව පුද්ගලයන් (වැඩිහිටියන් ) 25 ක් හෝ වැඩියෙන් එහෙත් පුද්ගලයන් (වැඩිහිටයන්) 35කට අඩුවෙන් ප්‍රවාහනය සඳහා වූ, අවුරුදු දහයකට වඩා නොපැරණි මෝටර් වාහන: | | |
| | | 8702.90.55 | ---- | අනෙකුත්, අවුරුදු 05 කට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | අනෙකුත්, අවුරුදු දහයකට වඩා නොපැරණි: | | |
| | | 8702.90.75 | ---- | අනෙකුත්, අවුරුදු 05 කට වඩා නොපැරණි | **TS** | |
| | | | | | | |
| **199** | **87.03** | | | **(87.02 ශීර්ෂයේ ඒවා හැර), ස්ටේෂන් වැගන් සහ රේසිං කාර් ඇතුළුව ප්‍රධාන වශයෙන් පුද්ගලයන් ප්‍රවාහනය කිරීම සඳහා සැළසුම් කරන ලද මෝටර් කාර් සහ අනෙකුත් මෝටර් වාහන.** | | |
| | | 8703.10 | - | හිම මත ගමන් කිරීම සඳහා විශේෂයෙන් සැළසුම් කරන ලද වාහන, ගොල්ෆ් කාර් සහ ඒ හා සමාන වාහන : | | |
| | | | --- | අවුරුදු තුනකට වඩා නොපැරණි : | | |
| | | 8703.10.11 | ---- | විද්‍යුත් ගොල්ෆ් කාර් | **TS** | |
| | | | --- | ස්ටේෂන් වැගන් සහ රේසිං කාර් ඇතුළුව, අවුරුදු තුනකට වඩා නොපැරණි මෝටර් කාර්: | | |
| | | 8703.21.62 | ---- | කුඩා ප්‍රමාණයේ රේසිං කාර් | **TS** | |
| | | 8703.21.63 | ---- | අනෙකුත්, සිලින්ඩර ධාරිතාවය ඝන සෙන්ටි මීටර 300 නොඉක්මවූ ක්වොඩ්‍රිසයිකල් ඇතුළුව | **TS** | |
| | | 8703.21.64 | ---- | භූමියේ සියළු තැන යා හැකි වාහන (ඒ.ටී.වී) | **TS** | |
| | | | --- | ස්ටේෂන් වැගන් සහ රේසිං කාර් ඇතුළුව අවුරුදු තුනකට වඩා පැරණි මෝටර් කාර්: | | |
| | | 8703.21.73 | ---- | භූමියේ සියළු තැන යා හැකි වාහන (ඒ.ටී.වී) | **TS** | |
| | | | --- | ස්ටේෂන් වැගන් සහ රේසිං කාර් ඇතුළු සිලින්ඩර ධාරිතාවය ඝන සෙන්ටිමීටර 1,000 නොඉක්මවන මෝටර් කාර්: | | |
| | | 8703.40.21 | ---- | කුඩා ප්‍රමාණයේ රේසිං කාර්, වසර තුනකට වඩා නොපැරණි | **TS** | |
| | | 8703.40.23 | ---- | සිලින්ඩර ධාරිතාවය ඝන සෙන්ටිමීටර 300 නොඉක්මවන ක්වොඩ්‍රිසයිකල්, වසර 03 කට වඩා නොපැරණි | **TS** | |

උපලේඛනය *(සම්බන්ධිතයි)*

| | *I තීරුව* ශීර්ෂ අංකය | *II තීරුව* සංයෝජිත වර්ගීකරණ සංකේතය | | *III තීරුව* විස්තරය | *IV තීරුව* තාවකාලික අත්හිටුවීම (TS) අ ලැයිස්තුව | *V තීරුව* තාවකාලික අත්හිටුවීම (TS) ආ ලැයිස්තුව |
|---|---|---|---|---|---|---|
| | | 8703.40.25 | ---- | භූමියේ සියළු තැන යා හැකි වාහන (ඒ.ටී.වී.), අවුරුදු තුනකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | ස්ටේෂන් වැගන් සහ රේසිං කාර් ඇතුළුව සිලින්ඩර ධාරිතාවය ඝන සෙන්ටිමීටර 1,000 නොඉක්මවන වාහන : | | |
| | | 8703.50.21 | ---- | කුඩා ප්‍රමාණයේ රේසින් කාර්, වසර තුනකට වඩා නොපැරණි | **TS** | |
| | | 8703.50.23 | ---- | සිලින්ඩර ධාරිතාවය ඝන සෙන්ටිමීටර 300 නොඉක්මවන ක්වොඩ්‍රිසයිකල්, වසර තුනකට වඩා නොපැරණි | **TS** | |
| | | 8703.50.25 | ---- | භූමියේ සියළු තැන යා හැකි වාහන (ඒ.ටී.වී), අවුරුදු තුනකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | ස්ටේෂන් වැගන් සහ රේසිං කාර් ඇතුළුව සිලින්ඩර ධාරිතාවය ඝන සෙන්ටිමීටර 1,000 නොඉක්මවන මෝටර් කාර්: | | |
| | | 8703.60.21 | ---- | කුඩා ප්‍රමාණයේ රේසිං කාර්, වසර තුනකට වඩා නොපැරණි | **TS** | |
| | | 8703.60.23 | ---- | සිලින්ඩර ධාරිතාවය ඝන සෙන්ටිමීටර 300 නොඉක්මවන ක්වොඩ්‍රිසයිකල්, වසර තුනකට වඩා නොපැරණි | **TS** | |
| | | 8703.60.25 | ---- | භූමියේ සියළු තැන යා හැකි වාහන (ඒ.ටී.වී), අවුරුදු තුනකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | ස්ටේෂන් වැගන් සහ රේසිං කාර් ඇතුළුව සිලින්ඩර ධාරිතාවය ඝන සෙන්ටිමීටර 1,000 නොඉක්මවන මෝටර් කාර්: | | |
| | | 8703.70.21 | ---- | කුඩා ප්‍රමාණයේ රේසිං කාර් වසර තුනකට වඩා නොපැරණි | **TS** | |
| | | 8703.70.23 | ---- | සිලින්ඩර ධාරිතාවය ඝන සෙන්ටිමීටර 300 නොඉක්මවන ක්වොඩ්‍රිසයිකල්, වසර තුනකට වඩා නොපැරණි | **TS** | |
| | | 8703.70.25 | ---- | භූමියේ සියළු තැන යා හැකි වාහන (ඒ.ටී.වී), අවුරුදු තුනකට වඩා නොපැරණි | **TS** | |
| | | | | | | |
| **200** | **87.04** | | | **බඩු ප්‍රවාහනය කිරීම සඳහා වූ මෝටර් වාහන.** | | |
| | | 8704.10 | - | මහා මාර්ගයෙන් බැහැර පාවිච්චිය සඳහා සැළසුම් කළ ඩම්පර | **TS** | |
| | | | - | පීඩන-ජ්වලන අභ්‍යන්තර දහන පිස්ටන් එන්ජිමක් පමණක් සහිත (ඩීසල් හෝ අර්ධ-ඩීසල්), අනෙකුත්: | | |
| | | 8704.21 | -- | දළ වාහන බර ටොන් 5 නොඉක්මවූ : | | |
| | | | - | විශේෂ කාර්යය ටැන්කර/ බවුසර සහ ට්‍රක් රථ: | | |
| | | 8704.21.11 | ---- | කිරි ප්‍රවාහනය සඳහා වූ මළ නොබැඳෙන වානේ ටැංකි සහිත, ටැන්කර සහ බවුසර, අවුරුදු පහකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | ත්‍රීරෝද රථ : | | |
| | | 8704.21.21 | ---- | අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | එන්ජින් සහ කුටි සවිකළ චැසි: | | |
| | | 8704.21.31 | ---- | ජාතික උප බෙදුම් 8704.21.43 හි වාහන සඳහා, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.21.33 | ---- | ජාතික උප බෙදුම් 8704.21.51 හි වාහන සඳහා, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |

උපලේඛනය *(සම්බන්ධිතයි)*

| | *I* තීරුව **ශීර්ෂ අංකය** | *II* තීරුව **සංයෝජිත වර්ගීකරණ සංකේතය** | | *III* තීරුව **විස්තරය** | *IV* තීරුව **තාවකාලික අත්හිටුවීම (TS) අ ලැයිස්තුව** | *V* තීරුව **තාවකාලික අත්හිටුවීම (TS) ආ ලැයිස්තුව** |
|---|---|---|---|---|---|---|
| | | 8704.21.35 | ---- | ජාතික උප බෙදුම් **8704.21.63** හි වාහන සඳහා, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.21.37 | ---- | ජාතික උප බෙදුම් **8704.21.67** හි වාහන සඳහා, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | මගීන්ට හා භාණ්ඩ සඳහා වෙන වෙනම කුටීර සහිත හා රියදුරු ඇතුළුව පුද්ගලයින් (වැඩිහිටියන්) තිදෙනෙකුට හෝ නොවැඩි ගණනකට යා හැකි වන සේ සැලසුම් කරන ලද, එහෙත් අන් කවර හෝ කටයුත්තකට යොදා ගත හැකි වැඩිමනත් ඉඩකින් තොර මගී ප්‍රවාහන කුටීරයක් සහිත, භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්‍රෑම් **2,000** කට නොවැඩි වාහන, නමුත් එන්ජින් කොටස සම්පූර්ණයෙන්ම රියදුරු කුටියෙන් වාහනයේ ඉදිරියට නෙරා ඇති වාහන හැර අනෙකුත් වාහන : | | |
| | | 8704.21.41 | ---- | භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්‍රෑම් **800** ට අඩු, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.21.43 | ---- | භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්‍රෑම් **800** ක් හෝ වැඩි, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | මගීන්ට හා භාණ්ඩ සඳහා වෙන වෙනම කුටීර සහිත හා රියදුරු ඇතුළුව පුද්ගලයින් (වැඩිහිටියන්) තිදෙනෙකුට හෝ නොවැඩි ගණනකට යා හැකි වන සේ සැලසුම් කරන ලද, එහෙත් අන් කවර හෝ කටයුත්තකට යොදා ගත හැකි වැඩිමනත් ඉඩකින් තොර මගී ප්‍රවාහන කුටීරයක් සහිත, භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්‍රෑම් **2,000** හෝ ඊට වැඩි වාහන: | | |
| | | 8704.21.51 | ---- | අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | මගීන්ට හා භාණ්ඩ සඳහා වෙන වෙනම කුටීර සහිත හා රියදුරු ඇතුළුව පුද්ගලයින් (වැඩිහිටියන්) තිදෙනෙකුට හෝ නොවැඩි ගණනකට යා හැකි වන සේ සැලසුම් කරන ලද, එහෙත් අන් කවර හෝ කටයුත්තකට යොදා ගත හැකි වැඩිමනත් ඉඩකින් තොර මගී ප්‍රවාහන කුටීරයක් සහිත, භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්‍රෑම් **2,000** කට නොවැඩි වාහන: | | |
| | | 8704.21.61 | ---- | ඉදිරිපස දුනු කොල වර්ගයේ අවලම්බක සහිත, භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්‍රෑම් **800**ට අඩු, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.21.63 | ---- | ඉදිරිපස දුනු කොල වර්ගයේ අවලම්බක සහිත, භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්‍රෑම් **800**ක් හෝ වැඩි, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.21.65 | ---- | අනෙකුත් භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්‍රෑම් **800** ට අඩු, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.21.67 | ---- | අනෙකුත් භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්‍රෑම් **800** ක් හෝ වැඩි, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |

උපලේඛනය *(සම්බන්ධිතයි)*

| | *I* තීරුව<br>ශීර්ෂ අංකය | *II* තීරුව<br>සංයෝජිත වර්ගීකරණ සංකේතය | | *III* තීරුව<br>විස්තරය | *IV* තීරුව<br>තාවකාලික අත්හිටුවීම (TS)<br>අ ලැයිස්තුව | *V* තීරුව<br>තාවකාලික අත්හිටුවීම (TS)<br>ආ ලැයිස්තුව |
|---|---|---|---|---|---|---|
| | | | --- | කුටිය සහ භාණ්ඩ ප්‍රදේශය සඳහා වෙන්වූ බඳවල් සහිත, රියදුරු ඇතුළුව පුද්ගලයන් (වැඩිහිටියන්) හයදෙනෙකුට නොවැඩි ගණනකට යා හැකි වන සේ සැළසුම් කරන ලද, එහෙත් අන් කවර හෝ කටයුත්තකට යොදා ගත හැකි වැඩිමනත් ඉඩකින් තොර මගී ප්‍රවාහන කුටීරයක් සහිත, භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්‍රෑම් **800** ක් හෝ වැඩි, නමුත් එන්ජින් කොටස සම්පූර්ණයෙන්ම රියදුරු කුටියෙන් වාහනයේ ඉදිරියට නෙරා ඇති වාහන හැර අනෙකුත් වාහන : | | |
| | | 8704.21.71 | ---- | අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | අනෙකුත්: | | |
| | | 8704.21.91 | ---- | කුටිය සහ භාණ්ඩ ප්‍රදේශය සඳහා වෙන් වූ බඳවල් සහිත, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.21.93 | ---- | අනෙකුත්, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.22 | -- | දළ වාහන බර ටොන් **5** ඉක්මවූ එහෙත් ටොන් **20** නොඉක්මවූ : | | |
| | | | --- | කිරි ප්‍රවාහනය සඳහා වූ මළ නොබැඳෙන වානේ ටැංකි සහිත ටැංකර සහ බවුසර, ශීතාගාරික ට්‍රක් රථ; | | |
| | | 8704.22.41 | ---- | අවුරුදු පහකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.22.42 | ---- | අවුරුදු පහකට වඩා පැරණි නමුත් වසර දහයකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | අනෙකුත් : | | |
| | | 8704.22.61 | ---- | අවුරුදු පහකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.22.62 | ---- | අවුරුදු පහකට වඩා පැරණි නමුත් වසර දහයකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.23 | -- | දළ වාහන බර ටොන් **20** ඉක්මවූ : | | |
| | | | --- | කිරි ප්‍රවාහනය සඳහා වූ මළ නොබැඳෙන වානේ ටැංකි සහිත ටැංකර සහ බවුසර, ශීතාගාරික ට්‍රක් රථ; | | |
| | | 8704.23.51 | ---- | අවුරුදු පහකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.23.52 | ---- | අවුරුදු පහකට වඩා පැරණි නමුත් අවුරුදු දහයකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | අනෙකුත් : | | |
| | | 8704.23.71 | ---- | අවුරුදු පහකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.23.72 | ---- | අවුරුදු පහකට වඩා පැරණි නමුත් අවුරුදු දහයකට වඩා නොපැරණි | **TS** | |
| | | | - | පුළිඟු-ජ්වලන අභ්‍යන්තර දහන පිස්ටන් එන්ජිමක් පමණක් සහිත අනෙකුත් : | | |
| | | 8704.31 | -- | දළ වාහන බර ටොන් **5** නොඉක්මවූ : | | |
| | | | --- | විශේෂ අරමුණු සඳහා ටැංකි, බවුසර සහ ට්‍රක් රථ: | | |
| | | 8704.31.11 | ---- | කිරි ප්‍රවාහනය සඳහා වූ මළ නොබැඳෙන වානේ ටැංකි සහිත, ටැන්කර සහ බවුසර : අවුරුදු පහකට වඩා නොපැරණි | **TS** | |

උපලේඛනය *(සම්බන්ධිතයි)*

| | *I* තීරුව<br>ශීර්ෂ අංකය | *II* තීරුව<br>සංයෝජිත වර්ගීකරණ සංකේතය | | *III* තීරුව<br>විස්තරය | *IV* තීරුව<br>තාවකාලික අත්හිටුවීම (TS) අ ලැයිස්තුව | *V* තීරුව<br>තාවකාලික අත්හිටුවීම (TS) ආ ලැයිස්තුව |
|---|---|---|---|---|---|---|
| | | 8704.31.13 | ---- | හකුළා ගැනීමේ යාන්ත්‍රණය සහිත කසළ අපහරණ රථ, අවුරුදු පහකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | ත්‍රිරෝද රථ : | | |
| | | 8704.31.22 | ---- | අනෙකුත්, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | එන්ජින් සහ කුටි සවිකළ වැසි | | |
| | | 8704.31.31 | ---- | ජාතික උප බෙදුම් 8704.31.43 හි වාහන සඳහා, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.31.33 | ---- | ජාතික උප බෙදුම් 8704.31.51 හි වාහන සඳහා, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.31.35 | ---- | ජාතික උප බෙදුම් 8704.31.63 හි වාහන සඳහා, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | මගීන්ට හා භාණ්ඩ සඳහා වෙන වෙනම කුටීර සහිත හා රියදුරු ඇතුළුව පුද්ගලයින් (වැඩිහිටියන්) තිදෙනෙකුට හෝ නොවැඩි ගණනකට යා හැකි වන සේ සැළසුම් කරන ලද, එහෙත් අන් කවර හෝ කටයුත්තකට යොදා ගත හැකි වැඩිමනත් ඉඩකින් තොර මගී ප්‍රවාහන කුටීරයක් සහිත, භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්‍රෑම් 2,000 කට නොවැඩි වාහන, නමුත් එන්ජින් කොටස සම්පූර්ණයෙන්ම රියදුරු කුටියෙන් වාහනයේ ඉදිරියට නෙරා ඇති වාහන හැර අනෙකුත් වාහන: | | |
| | | 8704.31.41 | ---- | භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්‍රෑම් 800 ට අඩු, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.31.43 | ---- | භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්‍රෑම් 800 ක් හෝ වැඩි, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | මගීන්ට හා භාණ්ඩ සඳහා වෙන වෙනම කුටීර සහිත හා රියදුරු ඇතුළුව පුද්ගලයින් (වැඩිහිටියන්) තිදෙනෙකුට හෝ නොවැඩි ගණනකට යා හැකි වන සේ සැළසුම් කරන ලද, එහෙත් අන් කවර හෝ කටයුත්තකට යොදා ගත හැකි වැඩිමනත් ඉඩකින් තොර මගී ප්‍රවාහන කුටීරයක් සහිත, භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්‍රෑම් 2,000 හෝ ඊට වැඩි වාහන | | |
| | | 8704.31.51 | ---- | අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | මගීනට හා භාණ්ඩ සඳහා වෙන වෙනම කුටීර සහිත හා රියදුරු ඇතුළුව පුද්ගලයින් (වැඩිහිටියන්) තිදෙනෙකුට හෝ නොවැඩි ගණනකට යා හැකි වන සේ සැළසුම් කරන ලද, එහෙත් අන් කවර හෝ කටයුත්තකට යොදා ගත හැකි වැඩිමනත් ඉඩකින් තොර මගී ප්‍රවාහන කුටීරයක් සහිත, භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්‍රෑම් 2,000 කට නොවැඩි වාහන | | |
| | | 8704.31.61 | ---- | ඉදිරිපස දුනු කොල වර්ගයේ අවලම්බක සහිත, භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්‍රෑම් 800 ට අඩු, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |

උපලේඛනය *(සම්බන්ධිතයි)*

| | *I* තීරුව<br>**ශීර්ෂ අංකය** | *II* තීරුව<br>**සංයෝජිත වර්ගීකරණ සංකේතය** | | *III* තීරුව<br>**විස්තරය** | *IV* තීරුව<br>**තාවකාලික අත්හිටුවීම (TS) අ ලැයිස්තුව** | *V* තීරුව<br>**තාවකාලික අත්හිටුවීම (TS) ආ ලැයිස්තුව** |
|---|---|---|---|---|---|---|
| | | 8704.31.63 | ---- | ඉදිරිපස දුනු කොල වර්ගයේ අවලම්බක සහිත, භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්‍රෑම් 800 ක් හෝ වැඩි, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.31.65 | ---- | අනෙකුත් භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්‍රෑම් 800 ට අඩු, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.31.67 | ---- | අනෙකුත් භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්‍රෑම් 800 ක් හෝ වැඩි, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | කුටිය සහ භාණ්ඩ ප්‍රදේශය සඳහා වෙන්වූ බඳවල් සහිත හා රියදුරු ඇතුළුව පුද්ගලයින් (වැඩිහිටියන්) හයදෙනෙකුට නොවැඩි ගණනකට යා හැකි වන සේ සැලසුම් කරන ලද, එහෙත් අන් කවර හෝ කටයුත්තකට යොදා ගත හැකි වැඩිමනත් ඉඩකින් තොර මගී ප්‍රවාහන කුටීරයක් සහිත, භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්‍රෑම් 800 ක් හෝ වැඩි, නමුත් එන්ජින් කොටස සම්පූර්ණයෙන්ම රියදුරු කුටියෙන් වාහනයේ ඉදිරියට නෙරා ඇති වාහන හැර අනෙකුත් වාහන : | | |
| | | 8704.31.71 | ---- | අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | අනෙකුත්: | | |
| | | 8704.31.91 | ---- | කුටිය සහ භාණ්ඩ ප්‍රදේශය සඳහා වෙන් වූ බඳවල් සහිත, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.31.93 | ---- | අනෙකුත්, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.32 | -- | දළ වාහන බර ටොන් 5 ඉක්මවූ : | | |
| | | | --- | කිරි ප්‍රවාහනය සඳහා වූ මළ නොබැඳෙන වානේ ටැංකි සහිත ටැන්කර සහ බවුසර සහ ශීතාගාරික ට්‍රක් රථ: | | |
| | | 8704.32.41 | ---- | අවුරුදු පහකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.32.42 | ---- | අවුරුදු පහකට වඩා පැරණි නමුත් අවුරුදු දහය නොඉක්මවන | **TS** | |
| | | | ---- | හකුළා ගැනීමේ යාන්ත්‍රණය සහිත කසළ අපහරන රථ: | | |
| | | 8704.32.51 | ---- | අවුරුදු පහකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | අනෙකුත්: | | |
| | | 8704.32.61 | ---- | අවුරුදු පහකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.32.62 | ---- | අවුරුදු පහකට වඩා පැරණි නමුත් අවුරුදු දහය නොඉක්මවන | **TS** | |
| | | | - | අනෙකුත්, ඉදිරියට පැදවීම සඳහා මෝටර් ලෙස පීඩන-ජ්වලන ද්විත්වයම සහිත අභ්‍යන්තර දහන පිස්ටන් එන්ජින් (ඩීසල් හෝ අර්ධ-ඩීසල්) සහ විද්‍යුත් මෝටර | | |
| | | 8704.41 | -- | දළ වාහන බර ටොන් 5 නොඉක්මවන: | | |
| | | | --- | විශේෂ අරමුණු සඳහා ටැංකි, බවුසර සහ ට්‍රක් රථ: | | |
| | | 8704.41.11 | ---- | කිරි ප්‍රවාහනය සඳහා වූ මළ නොබැඳෙන වානේ ටැංකි සහිත ටැන්කර සහ බවුසර, අවුරුදු පහකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.41.13 | ---- | හකුළා ගැනීමේ යාන්ත්‍රණය සහිත කසළ අපහරණ රථ, අවුරුදු පහකට වඩා නොපැරණි | **TS** | |

උපලේඛනය *(සම්බන්ධිතයි)*

| | *I* තීරුව<br>ශීර්ෂ අංකය | *II* තීරුව<br>සංයෝජිත වර්ගීකරණ සංකේතය | | *III* තීරුව<br>විස්තරය | *IV* තීරුව<br>තාවකාලික අත්හිටුවීම (TS)<br>අ ලැයිස්තුව | *V* තීරුව<br>තාවකාලික අත්හිටුවීම (TS)<br>ආ ලැයිස්තුව |
|---|---|---|---|---|---|---|
| | | | --- | ත්‍රිරෝද රථ: | | |
| | | 8704.41.21 | ---- | අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | එන්ජින් සහ කුටි සවිකළ චැසි: | | |
| | | 8704.41.31 | ---- | ජාතික උප බෙදුම් 8704.41.43 හි වාහන සඳහා, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.41.33 | ---- | ජාතික උප බෙදුම් 8704.41.51 හි වාහන සඳහා, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.41.35 | ---- | ජාතික උප බෙදුම් 8704.41.63 හි වාහන සඳහා, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.41.37 | ---- | ජාතික උප බෙදුම් 8704.41.67 හි වාහන සඳහා, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | මගීනට හා භාණ්ඩ සඳහා වෙන වෙනම කුටීර සහිත හා රියදුරු ඇතුලුව පුද්ගලයින් (වැඩිහිටියන්) තිදෙනෙකුට හෝ නොවැඩි ගණනකට යා හැකි වන සේ සැළසුම් කරන ලද, එහෙත් අන් කවර හෝ කටයුත්තකට යොදා ගත හැකි වැඩිමනත් ඉඩකින් තොර මගී ප්‍රවාහන කුටීරයක් සහිත, භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්‍රෑම් 2000 ට නොවැඩි වාහන, නමුත් එන්ජින් කොටස සම්පූර්ණයෙන්ම රියැදුරු කුටියෙන් වාහනයේ ඉදිරියට නෙරා ඇති වාහන හැර<br>අනෙකුත් වාහන: | | |
| | | 8704.41.41 | ---- | භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්‍රෑම් 800 ට අඩු, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.41.43 | ---- | භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්‍රෑම් 800 ක් හෝ වැඩි, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | මගීනට හා භාණ්ඩ සඳහා වෙන වෙනම කුටීර සහිත හා රියදුරු ඇතුළුව පුද්ගලයින් (වැඩිහිටියන්) 3 දෙනෙකුට හෝ නොවැඩි ගණනකට යා හැකි වන සේ සැළසුම් කරන ලද, එහෙත් අන් කවර හෝ කටයුත්තකට යොදා ගත හැකි වැඩිමනත් ඉඩකින් තොර මගී ප්‍රවාහන කුටීරයක් සහිත, භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්‍රෑම් 2000 හෝ ඊට වැඩි වාහන: | | |
| | | 8704.41.51 | ---- | අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | මගීන්ට හා භාණ්ඩ සඳහා වෙන වෙනම කුටීර සහිත හා රියදුරු ඇතුළුව පුද්ගලයින් (වැඩිහිටියන්) 3 දෙනෙකුට හෝ නොවැඩි ගණනකට යා හැකි වන සේ සැලසුම් කරන ලදල එහෙත් අන් කවර හෝ කටයුත්තකට යොදා ගත හැකි වැඩිමනත් ඉඩකින් තොර මගී ප්‍රවාහන කුටීරයක් සහිත, භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්‍රෑම් 2000 ට නොවැඩි වාහන: | | |
| | | 8704.41.61 | ---- | ඉදිරිපස දුනුකොළ වර්ගයේ අවලම්භක සහිත, භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්‍රෑම් 800 ට අඩු, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |

උපලේඛනය *(සම්බන්ධිතයි)*

| | *I* තීරුව<br>ශීර්ෂ අංකය | *II* තීරුව<br>සංයෝජිත වර්ගීකරණ සංකේතය | | *III* තීරුව<br>විස්තරය | *IV* තීරුව<br>තාවකාලික අත්හිටුවීම (TS)<br>අ ලැයිස්තුව | *V* තීරුව<br>තාවකාලික අත්හිටුවීම (TS)<br>ආ ලැයිස්තුව |
|---|---|---|---|---|---|---|
| | | 8704.41.63 | ---- | ඉදිරිපස දුනුකොළ වර්ගයේ අවලම්භක සහිත, භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්රෑම් 800 ක් හෝ වැඩි, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.41.65 | ---- | අනෙකුත්, භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්රෑම් 800 ට අඩු, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.41.67 | ---- | අනෙකුත්, භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්රෑම් 800 ක් හෝ වැඩි, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | කුටිය සහ භාණ්ඩ ප්‍රදේශය සඳහා වෙන්වූ බඳවල් සහිතල රියදුරු ඇතුලුව පුද්ගලයින් (වැඩිහිටියන්) හය දෙනෙකුට නොවැඩි ගණනකට යා හැකි වන සේ සැළසුම් කරන ලදල එහෙත් අන් කවර හෝ කටයුත්තකට යොදා ගත හැකි වැඩිමනත් ඉඩකින් තොර මගී ප්‍රවාහන කුටීරයක් සහිත, භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්රෑම් 800 ක් හෝ වැඩි, නමුත් එංජින් කොටස සම්පූර්ණයෙන්ම රියදුරු කුටියෙන් වාහනයේ ඉදිරියට නෙරා ඇති වාහන හැර අනෙකුත් වාහන: | | |
| | | 8704.41.71 | ---- | අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | අනෙකුත් : | | |
| | | 8704.41.91 | ---- | කුටිය සහ භාණ්ඩ ප්‍රදේශය සඳහා වෙන්වූ බඳවල් සහිත, අවුරුදු හතරකට වඩා නොපැරණි, අනෙකුත් | **TS** | |
| | | 8704.41.93 | ---- | අනෙකුත්, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.42 | -- | දළ වාහන බර ටොන් 5 ඉක්මවූ නමුත් ටොන් 20 නොඉක්මවූ: | | |
| | | | --- | කිරි ප්‍රවාහනය සඳහා වූ මළ නොබැදෙන වානේ ටැංකි සහිත ටැන්කර සහ බවුසර, ශීතාගාරික ට්‍රක් රථ : | | |
| | | 8704.42.41 | ---- | අවුරුදු පහකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.42.42 | ---- | අවුරුදු පහකට වඩා පැරණි නමුත් අවුරුදු දහයකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | හකුලා ගැනීමේ යාන්ත්‍රනය සහිත කසළ අපහරණ රථ : | | |
| | | 8704.42.51 | ---- | අවුරුදු පහකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | අනෙකුත් : | | |
| | | 8704.42.61 | ---- | අවුරුදු පහකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.42.62 | ---- | අවුරුදු පහකට වඩා පැරණි නමුත් අවුරුදු දහයකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | කිරි ප්‍රවාහනය සඳහා මළ නොබැදෙන වානේ ටැංකි සහිත ටැන්කර සහ බවුසර, ශීතාගාරික ට්‍රක් රථ : | | |
| | | 8704.43.51 | ---- | අවුරුදු පහකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.43.52 | ---- | අවුරුදු පහකට වඩා පැරණි නමුත් අවුරුදු දහයකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | හකුලා ගැනීමේ යාන්ත්‍රනය සහිත කසළ අපහරණ රථ : | | |
| | | 8704.43.61 | ---- | අවුරුදු පහකට වඩා නොපැරණි | **TS** | |

උපලේඛනය *(සම්බන්ධිතයි)*

| | *I* තීරුව<br>**ශීර්ෂ අංකය** | *II* තීරුව<br>**සංයෝජිත වර්ගීකරණ සංකේතය** | | *III* තීරුව<br>**විස්තරය** | *IV* තීරුව<br>**තාවකාලික අත්හිටුවීම (TS) අ ලැයිස්තුව** | *V* තීරුව<br>**තාවකාලික අත්හිටුවීම (TS) ආ ලැයිස්තුව** |
|---|---|---|---|---|---|---|
| | | | --- | අනෙකුත් : | | |
| | | 8704.43.71 | ---- | අවුරුදු පහකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.43.72 | ---- | අවුරුදු පහකට වඩා පැරණි නමුත් අවුරුදු දහයකට වඩා නොපැරණි | **TS** | |
| | | | - | අනෙකුත්, ඉදිරියට පැදවීම සඳහා මෝටර් ලෙස පුලිඟු ජ්වලන අභ්‍යන්තර දහන පිස්ටන් එන්ජින් සහ විද්‍යුත් මෝටර් යන දෙකම සහිත: | | |
| | | 8704.51 | | දළ වාහන බර ටොන් 5 නොඉක්මවූ: | | |
| | | | --- | විශේෂ අරමුණු සඳහා ටැංකි, බවුසර සහ ට්‍රක් රථ : | | |
| | | 8704.51.11 | ---- | කිරි ප්‍රවාහනය සඳහා මළ නොබැඳෙන වානේ ටැංකි සහිත ටැන්කර සහ බවුසර, අවුරුදු පහකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.51.13 | ---- | හකුලා ගැනීමේ යාන්ත්‍රණය සහිත කසල අපහරණ රථ, අවුරුදු පහකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | එන්ජින් සහ කුටි සවිකළ චැසි: | | |
| | | 8704.51.31 | ---- | ජාතික උප බෙදුම් 8704.51.43 හි වාහන සඳහා, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.51.33 | ---- | ජාතික උප බෙදුම් 8704.51.51 හි වාහන සඳහා, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.51.35 | ---- | ජාතික උප බෙදුම් 8704.51.63 හි වාහන සඳහා, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.51.37 | ---- | ජාතික උප බෙදුම් 8704.51.67 හි වාහන සඳහා, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | මගීනට හා භාණ්ඩ සඳහා වෙන වෙනම කුටීර සහිත හා රියදුරු ඇතුළුව පුද්ගලයින් (වැඩිහිටියන්) 3 දෙනෙකුට හෝ නොවැඩි ගණනකට යා හැකි වන සේ සැලසුම් කරන ලද, එහෙත් අන් කවර හෝ කටයුත්තකට යොදා ගත හැකි වැඩිමනත් ඉඩකින් තොර මගීන් ප්‍රවාහන කුටීරයක් සහිත, භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්රෑම් 2000 ට නොවැඩි, නමුත් එංජින් කොටස සම්පූර්ණයෙන්ම රියදුරු කුටියෙන් වාහනයේ ඉදිරියට නෙරා ඇති වාහන හැර අනෙකුත් වාහන: | | |
| | | 8704.51.41 | ---- | භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්රෑම් 800 ට අඩු, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.51.43 | ---- | භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්රෑම් 800 ක් හෝ වැඩි, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | මගීනට හා භාණ්ඩ සඳහා වෙන වෙනම කුටීර සහිත හා රියදුරු ඇතුළුව පුද්ගලයින් (වැඩිහිටියන්) 3 දෙනෙකුට හෝ නොවැඩි ගණනකට යා හැකි වන සේ සැලසුම් කරන ලද, එහෙත් අන් කවර හෝ කටයුත්තකට යොදා ගත හැකි වැඩිමනත් ඉඩකින් තොර මගීන් ප්‍රවාහන කුටීරයක් සහිත, භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්රෑම් 2000 ට වැඩි වාහන: | | |
| | | 8704.51.51 | ---- | අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

| | *I* තීරුව<br>ශීර්ෂ අංකය | *II* තීරුව<br>සංයෝජිත වර්ගීකරණ සංකේතය | | *III* තීරුව<br>විස්තරය | *IV* තීරුව<br>තාවකාලික අත්හිටුවීම (TS) අ ලැයිස්තුව | *V* තීරුව<br>තාවකාලික අත්හිටුවීම (TS) ආ ලැයිස්තුව |
|---|---|---|---|---|---|---|
| | | | --- | මගීන්ට හා භාණ්ඩ සඳහා වෙන වෙනම කුටීර සහිත හා රියදුරු ඇතුලුව පුද්ගලයින් (වැඩිහිටියන්) තිදෙනෙකුට හෝ නොවැඩි ගණනකට යා හැකි වන සේ සැළසුම් කරන ලද, එහෙත් අන් කවර හෝ කටයුත්තකට යොදා ගත හැකි වැඩිමනත් ඉඩකින් තොර මගී ප්‍රවාහන කුටීරයක් සහිත, භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්‍රෑම් 2000 ට නොවැඩි වාහන: | | |
| | | 8704.51.61 | ---- | ඉදිරිපස දුනු කොල වර්ගයේ අවලම්බක සහිත, භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්‍රෑම් 800 ට අඩු, අවුරුදු හතරකට වඩා නොපැරණි: | **TS** | |
| | | 8704.51.63 | ---- | ඉදිරිපස දුනු කොල වර්ගයේ අවලම්බක සහිත, භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්‍රෑම් 800 ක් හෝ වැඩි, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.51.65 | ---- | අනෙකුත්, භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්‍රෑම් 800 ට අඩු, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.51.67 | ---- | අනෙකුත්, භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්‍රෑම් 800 ක් හෝ වැඩි, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | කුටිය සහ භාණ්ඩ ප්‍රදේශය සඳහා වෙන්වූ බඳවල් සහිත, රියදුරු ඇතුලුව පුද්ගලයින් (වැඩිහිටියන්) හයදෙනෙකුට නොවැඩි ගණනකට යා හැකි වන සේ සැළසුම් කරන ලද, එහෙත් අන් කවර හෝ කටයුත්තකට යොදා ගත හැකි වැඩිමනත් ඉඩකින් තොර මගී ප්‍රවාහන කුටීරයක් සහිත, භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව කිලෝග්‍රෑම් 800 ක් හෝ වැඩි, නමුත් එන්ජින් කොටස සම්පූර්ණයෙන්ම රියදුරු කුටියෙන් වාහනයේ ඉදිරියට නෙරා ඇති වාහන හැර අනෙකුත් වාහන: | | |
| | | 8704.51.71 | ---- | අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | අනෙකුත් : | | |
| | | 8704.51.91 | ---- | කුටිය සහ භාණ්ඩ ප්‍රදේශය සඳහා වෙන්වූ බඳවල් සහිත, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.51.93 | ---- | අනෙකුත්, අවුරුදු හතරකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.52 | -- | දළ වාහන බර ටොන් 5 ඉක්මවූ : | | |
| | | | --- | කිරි ප්‍රවාහනය සඳහා වූ මළ නොබැඳෙන වානේ ටැංකි සහිත ටැංකර සහ බවුසර, ශීතාගාරික ට්‍රක් රථ: | | |
| | | 8704.52.41 | ---- | අවුරුදු පහකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.52.42 | ---- | අවුරුදු පහකට වඩා පැරණි නමුත් අවුරුදු දහය නොඉක්මවන | **TS** | |
| | | | --- | හකුලා ගැනීමේ යාන්ත්‍රනය සහිත කසළ අපහරණ රථ: | | |
| | | 8704.52.51 | ---- | අවුරුදු පහකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | අනෙකුත් : | | |
| | | 8704.52.61 | ---- | අවුරුදු පහකට වඩා නොපැරණි | **TS** | |
| | | 8704.52.62 | ---- | අවුරුදු පහකට වඩා පැරණි නමුත් අවුරුදු දහය නොඉක්මවන | **TS** | |

උපලේඛනය *(සම්බන්ධිතයි)*

| | *I* තීරුව<br>**ශීර්ෂ අංකය** | *II* තීරුව<br>**සංයෝජිත වර්ගීකරණ සංකේතය** | | *III* තීරුව<br>**විස්තරය** | *IV* තීරුව<br>**තාවකාලික අත්හිටුවීම (TS) අ ලැයිස්තුව** | *V* තීරුව<br>**තාවකාලික අත්හිටුවීම (TS) ආ ලැයිස්තුව** |
|---|---|---|---|---|---|---|
| | | | - | අනෙකුත් වාහන, ඉදිරියට පැදවීම සඳහා විදුලි මෝටරයක් පමණක් සහිත: | | |
| | | 8704.60.10 | --- | විදුලි ඔටෝ ත්‍රීවීල් රථ: අවුරුදු පහකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | අනෙකුත්, විදුලි මෝටර මගින් ධාවනය වන, අවුරුදු පහකට වඩා නොපැරණි: | | |
| | | 8704.60.31 | ---- | ධාරිතාවය කිලෝ වොට් 50 නොඉක්මවන්නා වූ මෝටර් වාහන | **TS** | |
| | | 8704.60.32 | ---- | ධාරිතාවය කිලෝ වොට් 50 ඉක්මවන්නා වූ එහෙත් කිලෝ වොට් 100 නොඉක්මවන්නා වූ මෝටර් වාහන | **TS** | |
| | | 8704.60.33 | ---- | ධාරිතාවය කිලෝ වොට් 100 ඉක්මවන්නා වූ එහෙත් කිලෝ වොට් 200 නොඉක්මවන්නා වූ මෝටර් වාහන | **TS** | |
| | | 8704.60.34 | ---- | ධාරිතාවය කිලෝ වොට් 200 ඉක්මවන්නා වූ වාහන | **TS** | |
| | | 8704.90 | - | අනෙකුත් : | | |
| | | 8704.90.10 | --- | අවුරුදු පහකට වඩා නොපැරණි | **TS** | |
| | | | | | | |
| **201** | **87.05** | | | **ප්‍රධාන වශයෙන් පුද්ගලයන් හෝ බඩු ප්‍රවාහනය සඳහා සැලසුම් කරන ලද ඒවා හැර, විශේෂ කාර්යය මෝටර් වාහන (උදාහරණ වශයෙන්, ආපදා ලොරි, දොඹකර ලොරි, ගිනි නිවීමේ වාහන, කොන්ක්‍රීට් මිශ්‍ර කිරීමේ ලොරි, මාර්ග අතු ගෑමේ ලොරි, ඉසීමේ ලොරි, ජංගම වැඩපළ, ජංගම රශ්මි විද්‍යා ඒකක)** | | |
| | | 8705.10 | - | දොඹකර ලොරි: | | |
| | | 8705.10.10 | --- | අවුරුදු දහයකට වඩා නොපැරණි | | **TS** |
| | | 8705.20 | - | ජංගම විදුම් ඩෙරික්ස් : | | |
| | | 8705.20.10 | --- | අවුරුදු හතකට වඩා නොපැරණි | | **TS** |
| | | 8705.30 | - | ගිනි නිවීමේ වාහන : | | |
| | | 8705.30.10 | --- | අවුරුදු හතකට වඩා නොපැරණි | | **TS** |
| | | 8705.40 | - | කොන්ක්‍රීට් මිශ්‍ර කිරීමේ ලොරි | | |
| | | 8705.40.10 | --- | අවුරුදු දහයකට වඩා නොපැරණි | | **TS** |
| | | 8705.90 | - | අනෙකුත් : | | |
| | | | --- | අප ජලය උරාගැනීමට හැකි පොම්ප සහිත ගලි බවුසර: | | |
| | | 8705.90.21 | ---- | අවුරුදු හතකට වඩා නොපැරණි | | **TS** |
| | | | --- | කොන්ක්‍රීට් මිශ්‍ර කිරීමේ පොම්ප සහිත ලොරි: | | |
| | | 8705.90.31 | ---- | අවුරුදු දහයකට වඩා නොපැරණි | | **TS** |
| | | | --- | ජංගම වැඩපළ: | | |
| | | 8705.90.41 | **---** | නවීකරණය කරන ලද 87.02 ශීර්ෂයට අයත් වාහන, අවුරුදු තුනකට වඩා නොපැරණි | **TS** | |

උපලේඛනය *(සම්බන්ධිතයි)*

| *I* තීරුව<br>ශීර්ෂ අංකය | *II* තීරුව<br>සංයෝජිත වර්ගීකරණ සංකේතය | | | *III* තීරුව<br>විස්තරය | *IV* තීරුව<br>තාවකාලික අත්හිටුවීම (TS) අ ලැයිස්තුව | *V* තීරුව<br>තාවකාලික අත්හිටුවීම (TS) ආ ලැයිස්තුව |
|---|---|---|---|---|---|---|
| | | 8705.90.43 | ---- | නවීකරණය කරන ලද 87.03 ශීර්ෂයට අයත් වාහන, අවුරුදු තුනකට වඩා නොපැරණි | **TS** | |
| | | 8705.90.45 | ---- | නවීකරණය කරන ලද 87.04 ශීර්ෂයට අයත් වාහන, අවුරුදු තුනකට වඩා නොපැරණි | **TS** | |
| | | 8705.90.47 | ---- | අනෙකුත්, අවුරුදු හතකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | අනෙකුත්, නවීකරණය කරන ලද 87.02, 87.03 සහ 87.04 ශීර්ෂයට අයත් වාහන : | | |
| | | 8705.90.51 | ---- | නවීකරණය කරන ලද 87.02 ශීර්ෂයට අයත් වාහන, අවුරුදු තුනකට වඩා නොපැරණි | **TS** | |
| | | 8705.90.53 | ---- | නවීකරණය කරන ලද 87.03 ශීර්ෂයට අයත් වාහන, අවුරුදු තුනකට වඩා නොපැරණි | **TS** | |
| | | 8705.90.55 | ---- | නවීකරණය කරන ලද 87.04 ශීර්ෂයට අයත් වාහන, අවුරුදු තුනකට වඩා නොපැරණි | **TS** | |
| | | | --- | අනෙකුත් : | | |
| | | 8705.90.91 | ---- | දළ වාහන බර ටොන් 4 නොඉක්ම වූ අවුරුදු හතකට වඩා නොපැරණි (ඒරියල් ප්ලැට්ෆෝම් ට්‍රක්රථ හැර) | **TS** | |
| | | 8705.90.93 | ---- | දළ වාහන බර ටොන් 4 ඉක්ම වූ අවුරුදු හතකට වඩා නොපැරණි (ඒරියල් ප්ලැට්ෆෝම් ට්‍රක්රථ හැර) | **TS** | |
| | | 8705.90.94 | ---- | දළ වාහන බර ටොන් 4 ඉක්මවූ අවුරුදු හතකට වඩා පැරණි | **TS** | |
| | | | | | | |
| **204** | **87.12** | | | **මෝටරයක් සවි නොකළ, ද්විරෝද පා පැදි සහ (බෙදා හැරීමේ ත්‍රිරෝද පා පැදි ඇතුළුව) අනෙකුත් පා පැදි :** | | |
| | | 8712.00.10 | --- | බෙදා හැරීමේ ත්‍රි රෝද පා පැදි | **TS** | |
| | | | | | | |
| **205** | **87.16** | | | **ට්‍රේලර් සහ අර්ධ ට්‍රේලර් ; යාන්ත්‍රිකව ක්‍රියා නොකරන අනෙකුත් වාහන ; ඒවායේ කොටස්.** | | |
| | | 8716.10 | - | ගෙයක් හෝ කුඩාරමක් වශයෙන් පාවිච්චියට ගන්නා, තවලම් වර්ගයේ ට්‍රේලර් සහ අර්ධ-ට්‍රේලර්: | | |
| | | 8716.10.10 | --- | අවුරුදු පහකට වඩා නොපැරණි | | **TS** |
| | | 8716.20 | - | කෘෂිකාර්මික කටයුතු සඳහා පාවිච්චියට ගන්නා, ස්වයං පැටවීම හෝ ස්වයං බෑම කෙරෙන ට්‍රේලර් සහ අර්ධ ට්‍රේලර් : | | |
| | | 8716.20.10 | --- | අවුරුදු පහකට වඩා නොපැරණි | | **TS** |
| | | 8716.31 | -- | ටැන්කර ට්‍රේලර් සහ අර්ධ ට්‍රේලර් : | | |

උපලේඛනය *(සම්බන්ධිතයි)*

| | *I* තීරුව<br>ශීර්ෂ අංකය | *II* තීරුව<br>සංයෝජිත වර්ගීකරණ සංකේතය | | *III* තීරුව<br>විස්තරය | *IV* තීරුව<br>තාවකාලික අත්හිටුවීම (TS)<br>අ ලැයිස්තුව | *V* තීරුව<br>තාවකාලික අත්හිටුවීම (TS)<br>ආ ලැයිස්තුව |
|---|---|---|---|---|---|---|
| | | 8716.31.10 | --- | අවුරුදු පහකට වඩා නොපැරණි | | **TS** |
| | | 8716.39 | -- | අනෙකුත් : | | |
| | | 8716.39.10 | --- | අවුරුදු තුනකට වඩා නොපැරණි | | **TS** |
| | | 8716.40 | - | අනෙකුත් ට්‍රේලර් සහ අර්ධ ට්‍රේලර්: | | |
| | | 8716.40.10 | --- | අවුරුදු පහකට වඩා නොපැරණි | | **TS** |
| | | 8716.80 | - | අනෙකුත් වාහන : | | |
| | | 8716.80.20 | --- | වීල්බැරෝ | | **TS** |
| | | 8716.80.30 | --- | අවුරුදු පහකට වඩා නොපැරණි ; අනෙකුත් | | **TS** |
| | | 8716.90 | | කොටස්: | | |
| | | 8716.90.10 | --- | වීල්බැරෝ සඳහා වූ | | **TS** |

6.

6.1 ඉහත රෙගුලාසි අංක 5 හි සඳහන් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ වර්ගීකරණය කර ඇති මෝටර් වාහනයක්, විකිණීමේ අරමුණු සඳහා, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි ආනයනකරුවෙකු හෝ පුද්ගලික භාවිතය සඳහා ආනයනය කරනු ලබන ආනයනකරුවකු විසින්, එකී මෝටර් වාහනය විකිණීමේ අරමුණු සඳහා ආනයනය කර ඇත්නම් ගැනුම්කරුගේ නමින් හෝ ඔහුගේ/ඇයගේ පුද්ගලික භාවිතය සඳහා ආනයනය කර ඇත්නම් ආනයනකරුගේ නමින්, ආයාත බිල් පත්‍රයේ (රේගු ප්‍රකාශනයේ - CUSDEC) දිනයේ සිට දින 90ක් ඇතුළත ලියාපදිංචි කළ යුතුය.

6.2 ඉහත රෙගුලාසි අංක 5 හි සඳහන් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ වර්ගීකරණය කර ඇති මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ අරමුණ සපුරාලීම සඳහා ආනයනකරු හෝ ගැනුම්කරු විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නිකුත් කරන ලද බදු ගෙවන්නා හැඳින්වීමේ අංකය (බ.ගෙ.හැ.අ) ඇතුළත් දිවුරුම් ප්‍රකාශයක්, අනෙකුත් අවශ්‍ය ලියකියවිලි සමඟ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය.

**6.3 රෙගුලාසි අංක 6.1 සහ 6.2 හි අරමුණ සපුරාලීම සඳහා,**

(i) මෙම රෙගුලාසි ප්‍රකාරව ආනයනය කරන ලද මෝටර් වාහනයට අදාළ මෙම *ගැසට් නිවේදනයේ* අංකය සහ මිල, රක්ෂණ හා ගැල් කුලී වටිනාකම (CIF වටිනාකම) පිළිවෙළින් රේගු ප්‍රකාශනයේ කොටු අංක 44 සහ 46හි ඇතුළත් කිරීමට ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සහතික විය යුතුය.

(ii) මෝටර් වාහන ආනයනකරුවෙකු ලෙස මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි ඕනෑම ආනයනකරුවෙකුට නියමකර ඇති රෙගුලාසිවලට යටත්ව අවශ්‍ය මෝටර් වාහන ප්‍රමාණය ආනයනය කිරීමට අවසර ඇත.

(iii) ඉහත රෙගුලාසි අංක **6.3 (ii)** හි සඳහන් ආනයනකරුවෙකු හැර වෙනත් ඕනෑම ආනයනකරුවෙකුට, ආනයනය කරන ලද මෝටර් වාහනයක ආයාත බිල් පත්‍රයේ (රේගු ප්‍රකාශනයේ - CUSDEC) දිනයේ සිට මාස දොළහක (12) කාලයක් තුළ එක් (01) වාහනයක් පමණක් ආනයනය කිරීමට අවසර ඇත.

6.4 කිසියම් ආනයනකරුවෙකු ඉහත රෙගුලාසි අංක 6.1 හි නිශ්චිතව දක්වා ඇති පරිදි දින 90ක් ඇතුළත මෙම රෙගුලාසිවල විධිවිධාන අනුව ආනයනය කරන ලද යම්කිසි මෝටර් වාහන(යක්) ලියාපදිංචි කිරීමට අපොහොසත් වන්නේ නම්, මෝටර් වාහන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන අවස්ථාවේ දී, සරල අනුපාත ක්‍රමය අනුව ගණනය

කරනු ලබන, මෝටර් වාහනයේ මිල, රක්ෂණ හා ගැල් කුළී වටිනාකමින් (මි.ර.ගැ. වටිනාකම) 45%ක (සියයට හතලිස් පහක) උපරිම සීමාවකට යටත්ව අදාළ මෝටර් වාහනයේ මිල, රක්ෂණ හා ගැල් කුළී වටිනාකමින් (මි.ර.ගැ. වටිනාකම) 3%ක (සියයට තුනක) මාසික ප්‍රමාද ගාස්තුවක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවීමට එවැනි ආනයනකරුවෙකු බැඳී සිටී. මෙම රෙගුලාසියේ අරමුණ සපුරාලීම සඳහා,

(i) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් විසින් රෙගුලාසි අංක 5 හි සඳහන් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ වර්ගීකරණය කර ඇති සහ මෙම රෙගුලාසිවල විධිවිධාන අනුව ආනයනය කරන ලද කිසිදු මෝටර් වාහනයක් රේගු ප්‍රකාශනයේ දින සිට දින 90ක් ඉක්ම වූ පසු ඉහත සඳහන් කර ඇති පරිදි ප්‍රමාද ගාස්තු අයකිරීමකින් තොරව ලියාපදිංචි නොකළ යුතුය,

(ii) කිසිදු තත්වයක් යටතේ මාසික ප්‍රමාද ගාස්තු ගෙවීමෙන් නිදහස් කිරීමක් ලබා නොදෙන අතර,

(iii) ප්‍රමාද දින 30 කට අඩු ඕනෑම දින ගණනක් ද පූර්ණ දිනදර්ශිත මාසයක් ලෙස සලකනු ලැබේ.

6.5 මෙම රෙගුලාසි නිකුත් කළ දින සිට 2025 දෙසැම්බර් අවසානය දක්වා සෑම මාස හයක (06) කාල සීමාවක් තුළ සිය මුළු ආනයනික මෝටර් වාහනවලින් 25% කට වඩා වැඩි ප්‍රමාණයක් ඉහත අංක 6.1 රෙගුලාසියේ විධිවිධාන උල්ලංඝනය කරමින් ආනයනය කරන ඕනෑම ආනයනකරුවෙකුට මෙම රෙගුලාසිවල විධිවිධාන යටතේ අවම වශයෙන් මාස තිස් හයක (36) කාලයක් සඳහා මෝටර් වාහන ආනයනය කිරීම අත්හිටුවනු ලැබේ.

7. මෙම රෙගුලාසිවල අරමුණ සඳහා මෝටර් වාහනයක වයස යන්නෙන් එකී මෝටර් වාහනයේ නිෂ්පාදිත දිනය (නිෂ්පාදකයාගේ සහතිකයේ හෝ 2013 අප්‍රේල් 03 මස දිනැති අංක 1804/17 දරන අති විශෙෂ *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2013 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල සඳහන් අපනයන පරීක්ෂණ සහතිකයේ සඳහන් කර ඇති) සහ නෞභාර/ගුවන් භාර පත්‍රයේ දිනය අතර කාලය අදහස් කෙරේ.

8. ඉහත රෙගුලාසි අංක 5 හි සඳහන් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ වර්ගීකරණය කර ඇති ඕනෑම මෝටර් වාහනයක්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක **22/99**, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක **01/2018** සහ ඊට අදාළව පසුව සිදු **කළ සංශෝධන, සහ විදේශ කටයුතු අමාත්‍යාංශ** උපදෙස් මාලා අංක **226** අනුව තීරු බදු/බදු සහන ලබාදෙමින් නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ ආනයනය සහ රේගු නිෂ්කාශනය කිරීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් අවසර නොදිය යුතුය.

9. ඉහත රෙගුලාසි අංක 5හි සඳහන් ඕනෑම මෝටර් වාහනයක් මෙම රෙගුලාසිවලට සහ/හෝ මෝටර් වාහන ආනයනය කිරීමේදී අදාළ වන ඕනෑම පවත්නා නීති සහ රෙගුලාසිවලට පටහැනිව ආනයනය කර ඇත්නම්, එම මෝටර් වාහන(ය), සියලු ආශ්‍රිත පිරිවැය අදාළ ආනයනකරු විසින් දරනු ලැබ, ආයාත බිල් පත්‍රයේ (රේගු ප්‍රකාශනයේ - CUSDEC) දිනයේ සිට දින අනූවක් (90) ඇතුළත එකී ආනයනකරු විසින් ප්‍රති-අපනයනය කළ යුතු ය.

10. මෙම රෙගුලාසිවල විධිවිධාන යටතේ මෝටර් වාහන ආනයනය කිරීම සඳහා විවෘත කරන ලද ණයවර ලිපි පිළිබඳ දෛනික වාර්තාවක් බලපත්‍රලාභී බැංකු විසින් ආනයන හා අපනයන පාලක ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය.

11. මෙම රෙගුලාසිවල අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත, බලපත්‍රලාභී බැංකු වෙත හෝ වෙනත් අදාළ ආයතන වෙත "මෙහෙයුම් උපදෙස්" නිකුත් කරනු ලැබිය යුතුය.

12. ඉහත රෙගුලාසි අංක 9 හැර මෙම රෙගුලාසිවලට අදාළව පැන නගින ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අවසාන තීරණය, ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් ලබා දෙනු ලැබේ.

13. මෙම රෙගුලාසි 2025 ජනවාරි මස 28 වැනි දින සිට බලාත්මක වේ.

14. අර්ථ නිරූපණය;

14.1 නිෂ්පාදිත දිනය යන්නෙන් අදහස් වන්නේ;

නිෂ්පාදකයාගේ සහතිකයේ හෝ 2013 අප්‍රේල් මස 03 දිනැති අංක 1804/17 *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද **2013 අංක 02** දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල සඳහන් අපනයන පරීක්ෂණ සහතිකයේ දක්වා ඇති අදාළ මාසයේ පහළොස්වන දිනය (15).

14.2 නිෂ්පාදිත මාසය නිශ්චිතව දක්වා නොමැති අවස්ථාවක (නිෂ්පාදිත වර්ෂය පමණක් සඳහන්ව ඇත්නම්) ඉහත **14.1** හි සඳහන් අපනයන පරීක්ෂණ සහතිකයේ හෝ නිෂ්පාදකයාගේ සහතිකයේ නිශ්චිතව දක්වා ඇති වර්ෂයේ ජනවාරි පහළොස්වන (15 වන) දිනය, නිෂ්පාදිත දිනය ලෙස සැලකිය යුතුය.

EOG 01 - 0028

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.